( Thesis )

e 891.37 JAY

# A STUDY OF PROSODY & RHETORICS OF PALI POETRY

Ph. D. Thesis

K. L. A. D. JAYASENA ....

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

UNIVERSITY OF PERADENIYA
FACULTY OF ARTS
05 JUN 1997
SENIOR ASST. REGISTRAR

# පාලි ඡන්දෝලංකාර පිළිබඳ අධ්‍යයනයක්

ආචාර්ය උපාධි පර්යේෂණ නිබන්ධය

කේ. එල්. ඒ. ඩී. ජයසේන....

1994 - 1997

පේරාදෙණිය විශ්ව විද්‍යාලය

514796

# ග්‍රන්ථ සාරය

## පළමු වන පරිච්ඡේදය – හැඳින්වීම

පාලි ඡන්දෝලංකාරයන්ට පසු බිම වන වෛදික යුගයේ ඡන්දස් හා අලංකාර තත්ත්වය සොයා බැලීම මෙම පරිච්ඡේදයෙහි පරමාර්ථයයි. ඍග් වේදය භාරතීය සියලු ශාස්ත්‍රයන්ට සම්භවය ලබා දෙන්නා සේ ම භාරතීය ඡන්දස් හා අලංකාර ශාස්ත්‍රයන්ට ද උපත ලබා දෙයි. ඍග් වේදයේ එන ප්‍රධාන ඡන්දස් වගින් ඒ ඒ ඡන්දස් පදයෙහි යොදා ගත් ආකාරයන් විමසා බලමින් ඒ ඒ ඡන්දස්වල ලක්ෂණ මෙහි සංක්ෂේපානුසාරයෙන් පැහැදිලි කෙරෙයි. වෛදික ඡන්දස් මුලින් ම සාකච්ඡා කෙරෙන කෘති හඳුන්වා දීම ද වෛදික ඡන්දසෙහි මූලික ස්වරූපය ද පැහැදිලි කර ඍග් වේද සූක්තයන්හි ඡන්දස් ව්‍යාප්තිය පෙන්වා දීම ද මෙහි ඇතුළත්ය.

අලංකාර ශාස්ත්‍රය ඍග් වේදයෙහි පිළිබිඹුවන ආකාරයත් උපමා උත්පාදක විවිධ අවයව පදත් හඳුන්වා දී ඒවායේ භාවිතය මෙහි සැකෙවින් සාකච්ඡිතයි. අනුප්‍රාස, ශ්ලේෂ, යමක, අතිශයෝක්ති, ව්‍යතිරේක ආදී අලංකාර සැකෙවින් සඳහන් කර ඡන්දසත් අලංකාරයත් පශ්චාත් කාලීන ඡන්දස් හා අලංකාර ශාස්ත්‍රයන්ට පසු බිම සකසන අයුරු පෙන්වා දීමත් මේ පරිච්ඡේදයේ ප්‍රධාන කාර්යයයි.

## දෙවන පරිච්ඡේදය – මූලාශ්‍රය

පාලි පද්‍ය විචාරයට මෙම පර්යේෂණ කාර්යයෙහි උපයෝගී කර ගනු ලබන වුත්තෝදය හා සුබෝධාලංකාරය යන කෘති දෙක සැකෙවින් හඳුන්වා දී ඒවාට ගුරුහරුකම් ලබා ගත් පැරණි සංස්කෘත විචාර ග්‍රන්ථ ඉතාමත් සංක්ෂිප්තව විස්තර කොට ලක්දිව මෙම කලාව ප්‍රචලිත වීමට පෙර ලියැවුණු පාලි කෘතිවලට සංස්කෘත විචාර කලාවේ බලපෑම අවධාරණය කරමින් පාලි පද්‍ය විචාරයට සංස්කෘත විචාර කලාව ද නිරායාසයෙන් පිවිසෙන සැටි පෙන්වා දෙනු ලැබේ.

## තෙවන පරිච්ඡේදය – (අ) වුත්තෝදය ලක්ෂ්‍ය ලක්ෂණ විභාගය

වුත්තෝදය සැකසීමට යොදාගත් පද්‍ය වර්ග කරමින් එම ග්‍රන්ථයේ සැකැස්ම විස්තර කර පසුව ඡන්දස් ශාස්ත්‍රයෙහි අත්‍යවශ්‍ය පාරිභාෂික ශබ්ද හා ඒවායේ වැදගත්කම බුද්ධ මතය ඇසුරෙන් සාකච්ඡිතයි. ඡන්දස, සංකේත, සංඛ්‍යා පරිභාෂා, යති, මාත්‍රා වෘත්තය, එහි වර්ග, මාත්‍රා සම ජාති, සමවෘත්ත, අර්ධ සම වෘත්ත, විෂම වෘත්ත හා ෂට් ප්‍රත්‍යය විභාගය ආදිය සවිස්තරව විභාග කෙරෙයි.

### (ආ) සුබෝධාලංකාරය ලක්ෂ්‍ය ලක්ෂණ විභාගය

මෙහි අලංකාර ශාස්ත්‍රයෙහි අවබෝධ කටයුතු දෝෂ, දෝෂ පරිහාරය,

කාව්‍ය ගුණ ආදිය සැකෙවින් විස්තර කර අර්ථාලංකාරයට උපකාර වන අලංකාර තිස් පහ නිදසුන් සහිතව දක්වමින් රසාවබෝධය සාකච්ඡිතයි. මේ ආකාරයෙන් වුත්තෝදය හා සුබෝධාලංකාරයේත් මූල ධර්ම හා රීති දීර්ඝ සාකච්ඡාවට භාජන කෙරෙයි.

සිවුවන පරිච්ඡේදය – බුද්ධ වචනයෙහි ඡන්දෝලංකාර විභාගය

බුදු රදුන් ඡන්දස් හා අලංකාර ගැන දැක් වූ ආකල්පය ග්‍රන්ථ ගත කරුණු අනුව සැකෙවින් විභාග කර ත්‍රිපිටක පද්‍යයෙහි වැදගත් උද්ධෘත කොටස් ඇසුරෙන් ඡන්දස් හා අලංකාර භූමිකාව විචාරාත්මකව සාකච්ඡා කෙරෙයි.

පස්වන පරිච්ඡේදය – වුත්තෝදයට පෙර ඡන්දස්

වුත්තෝදය බිහි වීමට පෙර තිබුණු ප්‍රධානම පද්‍ය සම්භාරය ත්‍රිපිටක පද්‍ය බවත් එකී ත්‍රිපිටක පද්‍ය කෘතිවල එන පද්‍ය වුත්තෝදය පෙන්වා දී ඇති සම්මත හා රීති අනුව හඳුනාගෙන ඒවා වර්ගීකරණය මෙහි අරමුණයි. විධිමත් ඡන්දස් යටතේ වර්ණ වෘත්ත ද මාත්‍රා ජාති ද අවිධිමත් පද්‍යය ද විෂම වෘත්ත යටතේ පථ්‍යාවත්ත ආදිය ද වර්ග කොට හඳුනා ගනිමින් තෝරා ගත් නියැදිය අනුව ප්‍රතිශතය ද යොදා පද්‍යයන්හි වෘත්ත යොදා ගැනීමේ ප්‍රවණතාව විස්තර කෙරෙයි. වුත්තෝදයට පූර්වාසන්නයෙහි හෝ සමකාලීනව බිහි වූ පාලි පද්‍ය ( ප්‍රකරණ ) කෘති කිහිපයක ඡන්දස් විභාගය ද කෙරෙයි.

සයවන පරිච්ඡේදය – වුත්තෝදයෙන් පසු ඡන්දස් ව්‍යාප්තිය

වුත්තෝදය බිහි වීමෙන් අනතුරුව ලියැවුණු පාලි පද්‍ය කෘති රැසක් තෝරා ගෙන ඒවාට වුත්තෝදය යම් බල පෑමක් කළේ ද පශ්චාත් කාලීන කාව්‍යයන්හි ඡන්දස කෙතෙක් දුරට සංවර්ධනය වී දැ යි පුළුල් ව සාකච්ඡා කෙරෙයි.

සත්වන පරිච්ඡේදය – සුබෝධාලංකාරයට පෙර අලංකාර භාවිතය

සුබෝධාලංකාරයට පෙර පැවැති ප්‍රධානම කාව්‍ය සම්භාරය ත්‍රිපිටක පද්‍යයයි. ඊට පසුව ලියැවුණු පද්‍ය කෘති ද ත්‍රිපිටක පද්‍ය අලංකාරම අනුකරණය කර ඇත. ඒ නිසා ත්‍රිපිටක පද්‍ය කෘතීන්හි උපයුක්ත උපමාලංකාර සියල්ලම වාගේ උද්ධෘත පාඨ සමඟ දක්වා ඇති අතර රූපකාලංකාර, ශ්ලේෂාලංකාර හා ස්වභාවෝක්ත්‍යලංකාර ආදිය අවශ්‍ය හා අදාළ පරිදි සාකච්ඡා කර ඇත.

අටවන පරිච්ඡේදය – සුබෝධාලංකාරයෙන් පසු අලංකාර භාවිතය

සුබෝධාලංකාරයෙන් පසුව ලියැවුණු ප්‍රධාන කෘති කීපයක් හරස්කඩක් ලේ තෝරා ගෙන ඒවායේ අලංකාර කෙතෙක් දුරට සංවර්ධනය කර ඇතිදැ යි නිදර්ශන පෙන්වමින් සාකච්ඡාවට ලක්කෙරෙයි. පජ්ජමධු, ජිනාලංකාර, සමන්තකූට වණ්ණනා, ජිනචරිත, වුත්තමාලාසංදේශ, හත්ථවනගල්ලවිහාරවංස, පාරමී මහා සතක, සිරි රාමසංදේශ, ආදියෙහි සුබෝධාලංකාරයෙහි නිර්දිෂ්ට අලංකාර වර්ග ගැබ් වී ඇති ආකාරය විග්‍රහ කර තිබේ. ත්‍රිපිටක පද්‍යයන්ට පොදු "ඉව", "විය", "යථා" ආදී උපමාවාචී නිපාත පශ්චාත් කාලීන පාලි පද්‍යයෙහි ද යොදන ලද ආකාරය තවදුරටත් මෙහි සාකච්ඡිතයි.

නවවන පරිච්ඡේදය – තුලනය

බුද්ධ කාලීන ඡන්දස් හා අලංකාර ශාස්ත්‍රයේ ප්‍රතිමූර්තිය ත්‍රිපිටක පද්‍ය බවත් එවක පොදු ජන සාහිත්‍යයට අයත් මාත්‍රා ජාති වන ආර්යා, ගීති, ඖපච්ඡන්දසික, වෛතාලීය ආදිය ඇතැම් ත්‍රිපිටක පද්‍ය පන්තිවල යෙදී ඇති ආකාරයත් පෙන්වා දෙමින් වුත්තෝදයට පෙර හා පසු යුග දෙකෙහි රචිත පද්‍ය වණ්ණ ආදී ඡන්දස් අනුව ප්‍රතිශතයන්ගෙන් ගෙන යුග දෙකෙහි වෙනස්කම් පැහැදිලි කර ඇත. වණ්ණ වෘත්ත ත්‍රිපිටක පද්‍යමය කෘතිවලට වඩා ත්‍රිපිටක ගද්‍ය සහිත පද්‍ය කෘතිවල වර්ධනයක් දක්වන බවත්, ඒ යුග දෙකෙහි ම වෙනසටත් වඩා වර්ධනයක් වුත්තෝදයෙන් පසු යුගයේ රචිත පාලි පද්‍ය කාව්‍යයන්හි ඇති බවත් මෙහි පැහැදිලි කෙරේ. විවිධ අලංකාර ක්‍රම, දෘෂ්ටි ගෝචර රචා, දුෂ්කර බන්ධන ආදිය පාලි පද්‍යයට පිවිසි අයුරු නිදසුන් මගින් මෙහි සාකච්ඡිතයි.

දසවන පරිච්ඡේදය – නිගමනය

වෛදික යුගයෙහි සිට ඡන්දස හා අලංකාර සංවර්ධනය වී පාලි ඡන්දස් හා අලංකාරයන්ට පිවිසි ආකාරයත් පාලි පද්‍ය සංස්කෘත ආභාසයට ලක්වූ ආකාරයත් දක්වා වර්තමානයෙහි ප්‍රමාණවත් සංවර්ධනයක් දැකිය නො හැකි බවත් මෙහි අවධාරණය කෙරේ. තවද මෙම පර්යේෂණයෙහි විශේෂ කරුණු ගැන සඳහන් කරමින් පාලි පද්‍ය අධ්‍යයනයට නැවතත් යොමු විය යුතු කාලය එළඹ ඇති බව මෙහි අවධාරණය කර ඇත.

PERMANENT REF
FOR USE
LIBRA